**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජූලි 2014

## (52) ආර්ථික විද්‍යාව
(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් පිළිතුරු සැපයීමේදී තරමක පසුබෑමක් දක්නට ලැබුණි. එසේ වීමට හේතු වශයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයට ලක්වූ ඇතැම් දුර්වලතා පහත දැක්වේ:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40** (ලකුණු 02 බැගින් බහුවරණ ප්‍රශ්න 20)
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ සමස්ථ විෂය නිර්දේශය හා ආර්ථික විද්‍යාවට සම්බන්ධ ප්‍රායෝගික දැනුම ආවරණය වන ආකාරයට වේ. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

එහෙත් මෙම ප්‍රශ්න 20 සඳහා පිළිතුරු සැපයීමේ හැකියාව කුමන මට්ටමක පැවතියේ ද යන්න මැනීමට අයදුම්කරුවන්ගෙන් නියැදියක් අහඹු ලෙස තෝරා ගෙන නිරීක්ෂණය කිරීමේදී ප්‍රශ්න අංක (J), (L), (M), සහ (R) යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් බව දක්නට ලැබුණි. ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

**(J) ප්‍රශ්නය සඳහා**

2013 ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතය අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් සටහන් කර තිබුණේ 6.9% ලෙසය. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පරිශීලනය නොකිරීමේ අඩුව එයින් පැහැදිලි වේ.

**(L) ප්‍රශ්නය සඳහා**

ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය අඩු කිරීමට ගෙන ඇති පියවරක් ලෙස සැලකිය නොහැකි පියවර සඳහා වැඩි දෙනෙක් නිවැරදි පිළිතුර තෝරාගෙන නොතිබුණි.

**(M) ප්‍රශ්නය සඳහා**

ජාතික ගිණුම් ආශ්‍රිතව ගණනය කිරීමක් අපේක්ෂා කරන ලදී. පිළිතුරු සැපයීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ජාතික ගිණුම් සම්බන්ධ ප්‍රධාන සංකල්ප නිවැරදිව අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ.

**(R) ප්‍රශ්නය සඳහා**

අයවැය ලේඛනය පසුබිම් කරගත් ප්‍රශ්නයකි. එහි අරමුණු පිළිබඳ නිවැරදි අවබෝධයක් නොවූ බව පැහැදිලි වේ.

මේ අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා වැඩි ලකුණු ලබා ගත හැක්කේ විෂය නිර්දේශයට අයත් න්‍යායාත්මක දැනුම හා විෂය සම්බන්ධ නව ප්‍රවණතා මෙන්ම අනෙකුත් ප්‍රායෝගික ආර්ථික කරුණු පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගැනීමෙනි.

# B කොටස

මෙම කොටස ප්‍රශ්න 6 කින් සමන්විත වූ අතර එයින් අයදුම්කරුවන් විසින් තෝරාගත් ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සැපයිය යුතු විය.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** (i) නිෂ්පාදන සම්පත් ලැයිස්තුගත කිරීමත්, භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳපොල සහ නිෂ්පාදන සම්පත් සඳහා වෙළෙඳපොල අතර සම්බන්ධතාවය පිළිබඳව අයදුම්කරුවන්ගේ මූලික දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. නිෂ්පාදන සම්පත් ලැයිස්තු ගත කිරීම සාර්ථකව කර තිබුණි. එහෙත් ඇතැම් අයදුම්කරුවන් නිෂ්පාදන සම්පත් ලෙස,

(1) කෘෂිකාර්මික, කාර්මික, සේවා.

(2) තේ, පොල්, රබර්.

(3) ඛණිජතෙල්, ගල් අඟුරු, සූර්ය ශක්තිය.

වැනි වැරදි පිළිතුරු ද සපයා තිබුණි.

(ii) වෙළෙඳපොලවල් පිළිබඳ විස්තර කළද ඒ දෙක අතර අන්තර් සම්බන්ධතාවය බොහෝ අයදුම්කරුවන් විසින් දක්වා නොතිබුණි. ඒ වෙනුවට පහත දැ දක්වා තිබුණි:

(1) ජාතික ආදායම් වෘත්ත ප්‍රවාහ දක්වා තිබීම.

(2) වක්‍ර ඉල්ලුම හා ඍජු ඉල්ලුම වැරදි ලෙස දැක්වීම.

(3) සාධක වෙළෙඳපොලට ඇති ඉල්ලුම හා සැපයුම අනුව භාණ්ඩ වෙළෙඳපොල ක්‍රියාත්මක වන බව නොදැක්වීම.

**(b)** නිෂ්පාදන හැකියා මායිම වක්‍ර පිළිබඳ දැනුම මැනීම මෙයින් අපේක්ෂිත විය. ප්‍රශ්නයෙන් අසා තිබූ පිළිතුර පිළිබඳව නිශ්චිත අවබෝධයක් නොවූ බව දක්නට ලැබුණි. අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු අතර පහත සඳහන් වැරදි පිළිතුරුද දක්නට තිබුණි.

(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය වෙනස්වීමට අදාල කරුණු දැක්වීම.

(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට හා දකුණට වෙනස්වීම පමණක් දැක්වීම.

**(c)** (i) මෙම කොටසින් අපේක්ෂා කර ඇත්තේ අයදුම්කරුවන් සතු අර්ථක්‍රම පිළිබඳ දැනුම මැනීමයි. මෙය සරල ප්‍රශ්නයක් වුවද පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් කරුණු නිවැරදිව දක්වා නොමැත. පහත සඳහන් අඩුපාඩු දක්නට ලැබුණි:

(1) පරිවර්තන ආර්ථිකයක් යනු ධනවාදී ආර්ථිකයේ සිට සමාජ වාදයට පරිවර්තනය වීම ලෙස වැරදියට දැක්වීම.

(2) ධනවාදී ආර්ථික ක්‍රමයේ සිට මිශ්‍ර ආර්ථික ක්‍රමයට පරිවර්තනය වීම ලෙස වැරදියට දැක්වීම.

(3) ශ්‍රම සූක්පම ශිල්ප ක්‍රමයේ සිට ප්‍රාග්ධන සූක්ෂ්ම ක්‍රමයට මාරුවීම ලෙස දැක්වීම.

වැනි වැරදි පිළිතුරු දක්වා තිබුණි.

(ii) පරිවර්තන ආර්ථික ක්‍රියාවලියේ පොදු දර්ශක පිළිබඳව සාර්ථක පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු පිරිසකි. පහත සඳහන් අඩුපාඩු දක්නට ලැබුණි:

(1) මිල දර්ශක හඳුන්වා තිබීම.

(2) මානව දරිද්‍රතා දර්ශකය, මානව සංවර්ධන දර්ශකය ලෙස දැක්වීම.

මේ නිසා අයදුම්කරුවන් වැඩි දෙනෙක් ඉදිරිපත් කර තිබුණේ වැරදි පිළිතුරු වේ.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** පිරිවැය සංකල්පය පිළිබඳ දැනුම හා අවබෝධය මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරේ. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය තෝරා ගෙන නොතිබුණි. අදාල සංකල්ප අවබෝධ කරගෙන (MC, AC) වගුව සම්පූර්ණ කර තිබුණේ ඉතා සුළු පිරිසකි. සමහර අයදුම්කරුවන් පහත දැක්වෙන අඩුපාඩු දක්වා අඩු ලකුණු ලබා ගැනීමට සමත් විය.

(1) අදාල ප්‍රස්තාර නිවැරදිව ඇඳ නොතිබීම.

(2) අක්ෂ නම් කිරීම වැරදි ලෙස කිරීම.

(3) MC වක්‍රය නිවැරදි ලෙස ලකුණු නොකිරීමෙන් බොහෝ දෙනෙකුට ලකුණු නොලැබී යාම.

(4) නිෂ්ප්‍රමාණික ලාභය ගණනය කිරීම පිළිබඳ අනවබෝධය.

(5) MR = MC වන විට ලාභය උපරිම වන බව අයදුම්කරුවන් නොදැන සිටීම.

**(b)** ඒකාධිකාරී වෙළෙඳපලකට ඇතුළුවීමේ බාධක පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කළද, ලබා දී තිබූ පිළිතුරු බොහොමයක් අසාර්ථක ඒවා විය. බොහෝවිට ලියූ පිළිතුරුවල අඩංගු වූයේ ඒකාධිකාරී වෙළෙඳපොලක ලක්ෂණ වේ.

සමස්ථයක් ලෙස බලන විට අයදුම්කරුවන් වැඩි දෙනෙක් ප්‍රශ්නයේ කොටස් දෙකටම අඩු ලකුණු ලබාගෙන තිබූ බව දැක්විය හැකිය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** උපේක්ෂා වක්‍ර යන්ත පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මැනීම මෙම කොටසින් අපේක්ෂිත වුවත් වැඩි පිරිසක් නිවැරදි පිළිතුරු සපයා නොතිබුණි. ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූ පිළිතුර පිළිබඳව අවබෝධයක් නොවූ බවට *"ආන්තික ආදේශන අනුපාතය"* ගැන සඳහන් නොකිරීම සාක්ෂි දරයි. ඒ වෙනුවට ආන්තික ඵලදාව, හීනවන ආවස්ථික පිරිවැය දක්වා තිබුණි.

**(b)** ඉල්ලුම් තීරක පිළිබඳ දැනුම මැනීම අපේක්ෂිත වූ මෙම ප්‍රශ්නය ඉතා සරල විය. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා එයට හිමි උපරිම ලකුණු ලබා ගැනීමට සමත් විය. එහෙත් අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් පහත සඳහන් වැරදි කරුණු ඉදිරිපත් කර තිබීමද දක්නට ලැබුණි.

(1) සඵල ඉල්ලුමක් ඇතිවීමේ කොන්දේසි දැක්වීම.

(2) සැපයුම් තීරක දැක්වීම.

(3) ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධක ඉදිරිපත් කිරීම.

**(c)** පොදු භාණ්ඩ නිර්වචනය කිරීම අයදුම්කරුවන් වැඩි දෙනෙක් සාර්ථකව කිරීමට සමත් විය. එසේම පොදු භාණ්ඩ වල ලක්ෂණ නිවැරදිව ඉදිරිපත් කර තිබූ අතර ඇතැම් අයදුම්කරුවන්,

(1) අනිවාර්යයෙන් සපුරා ගත යුතු භාණ්ඩ.

(2) පරිභෝජනයේදී මිලක් ගෙවිය යුතු බව.

(3) මිලක් නොගෙවන්නන් පරිභෝජනයෙන් බැහැර කළ හැකි බව.

වැනි වැරදි ප්‍රකාශ ඉදිරිපත් කර අඩු ලකුණු ලබාගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** ජාතික ගිණුම් පිළිබඳ ඉතා සරල පිළිතුරු බලාපොරොත්තු වුවද බොහෝ අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු සපයා නොතිබුණි. එයට හේතු වශයෙන් පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය:

(1) විදීම් හා කාන්දුවීම් සංකල්ප මාරුකර දැක්වීම.

(2) විදීම් සඳහා ආනයන බදු උදාහරණ ලෙස දැක්වීම සහ කාන්දුවීම් සඳහා අපනයන දැක්වීම.

(3) විදීම් වලින් වෘත්ත ප්‍රවාහය සංකෝචනය වන බවත් කාන්දුවීම් වලින් වෘත්ත ප්‍රවාහය ප්‍රසාරණය වන බව දැක්වීම.

**(b)** (i) ඒක පුද්ගල ආදායම පිළිබඳව නිර්වචනය කිරීම බහුතරයක් අයදුම්කරුවන් ඉතා සාර්ථක අන්දමින් ඉදිරිපත් කර තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් සූත්‍රය ඉදිරිපත් කිරීමේදී මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීම වෙනුවට පහත සඳහන් වැරදි ආකාරයට දක්වා තිබුණි:

$$\frac{\text{මුළු ආදායම}}{\text{රටේ සිටින ජන සංඛ්‍යාව}}$$

(ii) ඒක පුද්ගල ආදායම මැනීමේ වැදගත්කම් 4 ක් දැක්වීම බෙහෝදුරට සාර්ථකව කර තිබුණේ ඉතා සුළු පිරිසකි. අන්තර්ජාතික සැසඳුම් සඳහා භාවිත කළ හැකි වීම, සමාජ සුබසාධනය, දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය මැනීම වැනි කරුණු ඉදිරිපත් කිරීම දක්නට ලැබුනේ සුළු වශයෙනි.

**(c)** ජාතික ආදායම ගණනය කිරීමේදී ඇතුලත් කරනු නොලබන ගනුදෙනු සඳහා අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. සංක්‍රාම, නීතිවිරෝධී ක්‍රියා, ගෘහ සේවය ආදිය දැක්වීමේදී සමහරෙක් නීති විරෝධී ක්‍රියා, පාතාල කටයුතු, මත්ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය ආදි වශයෙන් වෙන් වශයෙන් දක්වා තිබුණි. කෙසේ වුවත් මෙම කොටසට හිමි උපරිම ලකුණු අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ලබා ගැනීම ප්‍රශංසනීයයි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) මුදල් සැපයුම පිළිබඳව න්‍යායාත්මක දැනුම හා අවබෝධය මෙම කොටසින් මැනීම අපේක්ෂිත ය. අයදුම්කරුවන් වැඩි දෙනෙක් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබු අතර එයට හිමි උපරිම ලකුණු ලබා ගැනීමට සමත් විය. එහෙත් සමහර අයදුම්කරුවන් පහත දැක්වෙන අඩුපාඩු සහිත පිළිතුරු ලියා තිබුණි:

(1) එකතුකිරීමේ දෝෂ.

(2) පටු හා පුළුල් මුදල් සැපයුම අර්ථ දැක්වීමේදී නිවැරදි සංරචක තෝරා නොගැනීම.

උදා: පුළුල් මුදල් සැපයුමේ කොටසක් ලෙස අනේවාසික ගිණුම් හා මූල්‍ය නොවන ආයතනවල කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු අයත් බව දැක්වීම.

**(b)** ප්‍රශ්නයේ මෙම කොටසට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් ඉතා සුළු පිරිසක් ජංගම ගිණුම්වලට පොලියක් ලබාදෙන බවත්, මුදල් මගින් ගනුදෙනු කළ හැකි බවත් පිළිතුරුවල ඉදිරිපත් කර තිබුණි.

**(c)** ප්‍රශ්නයේ මෙම කොටසට නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු පිරිසකි. වැඩි දෙනෙක් ලකුණු ලබා නොතිබුණි. එසේ වීමට පහත සඳහන් කරුණු බලපාන ලදි:

(1) මුදලේ නාමික අගය හා මූර්ත අගය වෙන් වෙන් වශයෙන් තේරුම් නොගැනීම.

(2) මූර්ත අගය යනු කාසි හා නෝට්ටු සෑදීමට යන පිරිවැය ලෙස හැඳින්වීම.

(3) මූර්ත අගය විදේශ විනිමය අනුපාතය හා සසඳා දැක්වීම.

(4) මූර්ත අගය යනු මුදල් ඒකකයකින් විදේශ රටවලින් ගතහැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය ලෙස දැක්වීම.

(5) නාමික අගය යනු මුදලේ ද්‍රව්‍යමය අගය නැතහොත් රත්තරන් අගය ලෙස දැක්වීම.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** (i) ආර්ථික ස්ථායිතාව යන්න න්‍යායාත්මකව අර්ථ දක්වා තිබුණේ අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසකි. බහුතරයක් ලියූ පිළිතුරුවල අඩංගු වූයේ උද්ධමනයකින් තොරව ආර්ථිකය පවත්වාගෙන යාම, ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යාම ලෙස දැක්වීමයි.

(ii) ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් නොවූ බව පෙනුණි. ඒ සඳහා ඉදිරිපත් කර තිබුණේ රජයේ කාර්යයන් පිළිබඳවයි. මේ නිසා පහසුවෙන් ලකුණු ලබා ගැනීමට තිබූ අවස්ථාව මග හැරී තිබුණි.

**(b)** රාජ්‍ය ණය සහ රජය විසින් ණය ලබා ගැනීමට හේතු පිළිබඳව අයදුම්කරුවන් බොහෝ දෙනෙක් සාර්ථක පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර එම කොටසට වැඩි ලකුණු ලබාගත් බවක් පෙන්නුම් කෙරිණි.

**(c)** ආර්ථික විද්‍යාව පසුබිම් කරගත් ප්‍රායෝගික කරුණු මැනීම පිළිබඳ ප්‍රශ්නයක් වූ මෙයට බහුතරයක් නිදහසේ පිළිතුරු ඉදිරිපත් කිරීමක් දක්නට ලැබුණි. සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නය සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට බොහෝ අයදුම්කරුවන් සමත් විය.

- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කර තිබීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත සෘජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.
5. පිළිතුරු ලිවීමේදී න්‍යායාත්මක සංකල්ප විධිමත්ව ඉදිරිපත් කිරීම, අවශ්‍යතැන්හි උදාහරණ මගින් ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීම වැදගත් වේ.
6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.
10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
11. උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -